ප්‍රතිපත්ති පර්යේෂණ සාරාංශය

# බොර දිය තුළින් ඉදිරියට

## ශ්‍රී ලංකාවේ ආනයන, බදුවලින් නිදහස් කිරීමේ යෝජනා ක්‍රමවල නියාමන අකාර්යක්ෂමතාවය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්.

මෙම ප්‍රතිපත්ති සාරාංශය මඟින්, තෝරා ගත් යම් නිෂ්පාදන ප්‍රවර්ගයන් සඳහා පනවා ඇති ආනයන බදු වලින් නිදහස් කිරීමේ යෝජනා ක්‍රමවල දැනට බලපවත්නා යාන්ත්‍රණයන් විශ්ලේෂණය කිරීම හරහා මෙම ගැටළුව ඉස්මතු කිරීමත් පිරික්සා බැලීමත් සිදු කරනු ලබයි.


### සාරාංශය

නියාමන ක්‍රියා පටිපාටිවල ඵලදායීතාවය තීරණය කිරීමේදී ඒවායේ පුරෝකථන හැකියාව, කාර්යක්ෂමභාවය හා විවෘතභාවය තීරණාත්මක සාධක වේ. මෙම ගුණාංග නොමැති වූ විට අපේක්ෂිත ප්‍රතිඵල ජනනය කිරීමෙහි ලා එම ක්‍රියා පටිපාටි අසමත් වේ. එවැනි අපැහැදිලි ක්‍රියාවලීන් අවභාවිතයට ලක් වීමේ නැඹුරුවක් ද තිබේ.■


### මූලික සොයා ගැනීම්

ආනයන බදු යනු රජයක තීරණාත්මක ආදායම් මාර්ගයකි. ආනයනය කරන භාණ්ඩ අනුව ආනයනය කරන අවස්ථා-වේදී ආනයනකරුවාට එකිනෙකට වෙනස් බදු වර්ග පහක් ගෙවීමට සිදු වේ. එනම්, ආනයන බද්ද, ආනයන සෙස් බද්ද, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද (ව.ගු.සං.-බ.), ජාතිය ගොඩනැගීමේ බද්ද (ජා.ගො.බ.), හා එකතු කළ අගය මත බද්ද (වැට්) යි. ඒ අනුව බලන කළ, බදුවලින් නිදහස් කිරීමේ ක්‍රම යටතේ මෙම බදුවලට අදාළව ලබා දෙන බදු සහන බොහෝ ව්‍යාපාර සඳහා ඉමහත් පිරිවැය ඉතිරියක් වේ. මෙම යෝජනා ක්‍රම අවභාවිතා කරමින් බදු ගෙවීම් පැහැර හැරීමට ඇති අවස්ථා වැළැක්වීමේ අරමුණින් රජය විසින් ව්‍යාපාරවලට තම සුදුසුකම් පෙන්නුම් කිරීම සඳහා අනුගමනය කළ යුතු නිශ්චිත ක්‍රියාවලියක් නියම කර ඇත.

බදු වලින් නිදහස් කිරීමේ ක්‍රමය හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ඵලදායීතාවය පහත හෙළීමටත්, එය අවභාවිතා කිරීමේ විභවය පුළුල් කිරීමටත් හේතු වන මෙම ක්‍රමය තුළ පවතින ගැටළු තුනක් මෙම ප්‍රතිපත්ති සාරාංශය හඳුනා ගනී. සාරාංශය තුළ දී මෙම දුර්වලතා විශ්ලේෂණය කෙරෙන්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායීතාවය ඉහළ නැංවීමෙහි ලා තීරණාත්මක වන හරිතාගාර, බින්දු වාරිමාර්ග පද්ධති හා බහු නළ වැනි කෘෂිකාර්මික උපකරණ සඳහා ඇති බදු නිදහස් කිරීම් ක්‍රම වල ඇති දුර්වලතා වෙත විශේෂ අවධානය යොමු කරමිනි.■

i. අපැහැදිලි ක්‍රියාවලිය

බදු වලින් නිදහස් වීම සඳහා සුදුසුකම් ලැබීමට ව්‍යාපාර විසින් නියෝජිතායතන ගණනාවක් වෙතින් අනුමැති ලිපි ලබා ගත යුතු වේ. මෙම අනුමැතීන් ලබා ගැනීම සඳහා ස්ථාපිත කර ඇති ක්‍රියා පටිපාටිය ලේඛනගත කර හෝ පොදුවේ පහසුවෙන් ලබා ගත හැකි ලෙස හෝ නැත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම නියෝජිතායතන ලබා දෙන වාචික උපදෙස් මත රඳා පැවතීමට හෝ උපදෙස් ලබා ගැනීම සඳහා ආයතන වෙත පුද්ගලිකව යාමට ව්‍යාපාරවලට සිදු වේ. වෙරිටේ පර්යේෂණයේ දී සොයා ගැනුණේ විවිධ ආයතනවල විවිධ නිළධාරීන් විසින් ලබා දෙන වාචික උපදෙස්වල ඒකීයත්වයක් නොමැති වීම හේතුවෙන් ඒවායේ විශ්වසනීයත්වය සැකසහිත බවයි. තවද, ලේඛනගත ක්‍රියා-පටිපාටියක් නොමැති වීමෙන්, අපැහැදිලි පද්ධතියක් ඔස්සේ යැමට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා ගැනීම සඳහා ඉහළ තලයේ නිළධාරී තන්ත්‍රය වෙත ප්‍රවේශ විය නොහැකි නව ව්‍යාපාරවලට සාපේක්ෂව එම ප්‍රවේශයන්ගේ වර-ප්‍රසාදය ඇති ප්‍රධාන පෙළේ ව්‍යාපාරවලට වාසි සැලසෙයි.

ii. තීරණ නිළධාරීන්ගේ අයුතු අභිමතයට යටත් ය

රජයේ අදාළ නියෝජිතායතන විසින් බදු වලින් නිදහස් කර ගැනීමට අනුමැතිය ලබා දෙන්නේ කුමන උපමානයන්ට අනුව දැයි යන්න ලේඛනගත කර හෝ පොදුවේ පහසු-වෙන් ලබා ගත හැකි ලෙස හෝ නොමැත. තවද, සුදුසුකම් ලබන නිෂ්පාදනයන් ලැයිස්තුගත කර ඇති නෛතික ලේඛනය තුළ නිෂ්පාදනයන් හැඳින්වෙන්නේ එහි H.S. කේතයෙන්[1] නොව නිෂ්පාදන නාමයෙනි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ, අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය හා බදු වලින් නිදහස් වීමට නිෂ්පාදනයට ඇති සුදුසුකම පිලිබඳ තීරණ කාර්ය භාර නිළධාරීන්ගේ අයුතු අභිමතියට නතු වීමයි. මේ පවතින තත්ත්වය තුළ බදු සහන ලබා ගැනීමේ හැකියාව අවිනිශ්චිත වන අතර, යෝජනා ක්‍රමය අවභාවිතයට හා දූෂණයට ඇති ඉඩ විවර වේ.

iii. මෙම ක්‍රියාවලිය අවභාවිතා වීමේ නැඹුරුවක් ඇත

අපැහැදිලි සහ නිලධාරීන්ගේ අභිමතයට නතු වූ ක්‍රියාවලිය බදු පැහැර හැරීමේ අරමුණින් නිළධාරීන් සමඟ හවුල් වී අදාල නොවන භාණ්ඩ බදු රහිතව ආනයනය කිරීම හරහා අවභාවිතයට ලක්වීමේ නැඹුරුවක් තිබේ. යෝජනා ක්‍රමය හරහා ආනයනය කරන භාණ්ඩ පිලිබඳ දත්ත පැවතියේ නම්, මෙම ක්‍රියාවලි මඟින් ඉලක්ක කරන ප්‍රතිලාභීන්ට ඉන් අත් වන වාසි තක්සේරු කිරීමට හා ඉහත දැක්වූ ආකාරයේ අවභාවිතා අවස්ථාවන් අනාවරණය කර ගැනීමට ඉන් සහායක් ලැබෙනු ඇත. එවැනි දත්ත නොමැති වීම මෙවැනි අවභාවිතා සිදු වීමේ ඉඩ තවත් වැඩි කරයි.■

## පර්යේෂණ සාරාංශය

නවීන කෘෂිකාර්මික භාවිතාවන් දිරි ගැන්වීම හා වාණිජ කෘෂිකර්මය ඉහළ නැංවීම රජය දිගු කලක පටන් පවත්වා ගෙන පැමිණි ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයකි. උදාහරණයක් ලෙස, ඵලදායීතාවය වැඩි දියුණු කිරීමේ තාක්ෂණවේදයන් හා භාවිතාවන් හඳුන්වාදීම හරහා ක්ෂේත්‍රයේ වර්ධනයන් ඇති කිරීම සඳහා ගොවියන්ට, ගොවි සංවිධානවලට හා කෘෂි සැකසුම් ආයතනයන්ට 50% ක පොලී සහනයක් ලබා දීමට 2017 අයවැයෙන් යෝජනා කර තිබේ.[2] මෙම ක්‍රියාමාර්ග සැලසුම් කර ඇත්තේ මෙවැනි සහන නොමැතිව මිල දී ගත නොහැකි තරම් මිල අධික තාක්ෂණික උපකරණ ලබා ගැනීම සඳහා වගාකරුවන් දිරි ගැන්වීම වෙනුවෙනි. තාක්ෂණ උපකරණ සඳහා දැරිය යුතු පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ අගයක් වේ නම් කුඩා ගොවිපලවලට එවැනි උපකරණ යොදා ගැනීමට එය බාධාවක් වේ.[3] ශ්‍රී ලංකාවේ පනවා ඇති ආනයන බදු හේතුවෙන් ආනයනික තාක්ෂණ උපකරණ වල පිරිවැය තවත් වැඩි කර තිබේ.

නවීන කෘෂි උපකරණ භාවිතය වගාකරුවන්ට පැහැදිලිවම ප්‍රතිලාභ අත් කර දේ. නූතන තාක්ෂණය සීමිත ලෙස යොදා ගැනීම, කෘෂි ඵලදායීතාවයට මෙන්ම දේශගුණ වෙනස්වීම්වල බලපෑම්වලට මුහුණ දීමට කෘෂි ක්ෂේත්‍රයට ඇති හැකියාවට ද අහිතකර ලෙස බලපාන මූලික ගැටළුවකි.[4]

නවීන කෘෂි කාර්මික තාක්ෂණවේදයන් භාවිතය දිරි ගැන්වීම සඳහා, තෝරා ගත් කෘෂි උපකරණ රේගු බද්දෙන්, ආනයන සෙස් බද්දෙන් සහ එකතු කළ අගය මත බද්දෙන් (වැට්) නිදහස් කර ඇත (1 වන වගුව බලන්න). නිෂ්පා-

1 වන වගුව: රේගු බද්දෙන්, ආනයන සෙස් බද්දෙන් සහ එකතු කළ අගය මත බද්දෙන් (වැට්) නිදහස් කර ඇති කෘෂි උපකරණ සහ ඊට අවැසි අනුමැතීන්

| මුක්තිය | උපකරණය | සම්පාදිත නීතියේ දක්වා ඇති පරිදි බදු වලින් නිදහස ලබා ගැනීම සඳහා අවැසි අනුමැතීන් |
|---|---|---|
| රේගු බද්ද[5] | ▪ කාලගුණ මධ්‍යස්ථාන,<br>▪ හරිතාගාර,<br>▪ බහු නළ,<br>▪ ජල ඉසින/මිහිදුම් පද්ධති,<br>▪ බිංදු ජල වාරි මාර්ග පද්ධති,<br>▪ පොහොර නික්ෂේපණ පද්ධති,<br>▪ ජලද්‍රාවක කෘෂි පද්ධති,<br>▪ ශාකමය තෙතමන පටල,<br>▪ පොකුණු ඇතුරුම්,<br>▪ ඵලන ලද දැල් සඳහා ආවරණ. | 1) කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ලිපිය; සහ<br>2) රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්ගේ අනුමැතිය. |
| ආනයන සෙස් බද්ද[6] | ▪ කාලගුණ මධ්‍යස්ථාන,<br>▪ හරිතාගාර,<br>▪ බහු නළ,<br>▪ ජල ඉසින/මිහිදුම් පද්ධති,<br>▪ බිංදු ජල වාරි මාර්ග පද්ධති,<br>▪ පොහොර නික්ෂේපණ පද්ධති,<br>▪ ජලද්‍රාවක කෘෂි පද්ධති,<br>▪ ශාකමය තෙතමන පටල,<br>▪ පොකුණු ඇතුරුම්,<br>▪ ඵලන ලද දැල් සඳහා ආවරණ. | 1) කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ලිපිය; සහ<br>2) රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්ගේ අනුමැතිය. |
| වැට්[7] | ▪ හරිතාගාර,<br>▪ බහු නළ,<br>▪ හරිතාගාර ගොඩ නැගීම සඳහා අමුද්‍රව්‍ය. | 1) කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ලිපිය; සහ<br>2) රාජ්‍ය ෆිස්කල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්ගේ අනුමැතිය. |

දනයේ H.S. කේතය අනුව ඇතැම් භාණ්ඩ සඳහා මෙම බදුවලින් ඇතිවන සමුච්චිත බලපෑම මුළු පිරිවැයෙන් 50% ඉක්මවිය හැකි අතර, මෙම නිදහස කිරීම සඳහා ඉල්ලුම් කිරීම හරහා ව්‍යාපාරවලට ලබා ගත හැකි වාසිය ඉන් ඉස්මතු කෙරේ.

රජය ස්ථාපිත කර ඇති ක්‍රියාවලිය හරහා තම සුදුසුකම් තහවුරුකිරීමෙන් අනතුරුව, අදාළ රජයේ ආයතන වලින් අනුමැතීන් ලබා ගත යුතු යැයි ව්‍යාපාරවලට නියම කර තිබේ මෙම ක්‍රියාවලිය කෘෂි කාර්මික උපකරණවලට පමණක් නොව මෙවැනි බදු නිදහස් කිරීමේ යෝජනා ක්‍රම යටතේ ආනයනය කරන සියලු භාණ්ඩවලට අදාල වේ. කෘෂි උපකරණ ආනයනය සඳහා අදාල බදු නිදහස් කිරීමේ යෝජනාවලීන් සහ ඊට අදාල අනුමැතීන් 1 වගුවේ දක්වා ඇත.

බදු නිදහස් කිරීමේ ක්‍රම මගින් ඉලක්ක කරන ව්‍යාපාරවලට එම ප්‍රතිලාභ ලැබීමේ හැකියාව අඩපණ කරන, වර්තමාන ක්‍රියාවලිය තුළ ඇති ගැටළු තුනක් වෙරිටෙ පර්යේෂණයේ දී හඳුනා ගෙන ඇත: (1) ක්‍රියාවලිය විනිවිදභාවයෙන් තොර ය; (2) එය අයුතු ලෙස නිළධාරී අභිමතයට යටත් ය (3) එය අවභාවිතා වීමේ නැඹුරුවක් පවතී. ලේඛනගත හා පොදුවේ දැන ගත හැකි ක්‍රියාවලියක් නොමැති වීම, සුදුසුකම් ලබන නිෂ්පාදන H.S. කේත මගින් හඳුනා නොගැනීම හා බදු නිදහස් කිරීමේ යෝජනා ක්‍රම හරහා ආනයනය කරන භාණ්ඩ පිලිබඳ දත්ත නොමැතිවීම ඉහත ගැටළු පැන නැගීමට හේතු වී තිබේ.

### 1.1. ක්‍රියාවලියේ විනිවිදබවක් නොමැති වීම

බදු වලින් නිදහස ලබා ගැනීම සඳහා අනුමැති ලිපි ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු සොයා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට නව හෝ පළමුවර ආනයනය කරන්නන්ට සිදු වී තිබේ. (i) සුදුසුකම් මැනීමේ උපමානයන්, (ii) සුදුසුකම් ලබන භාණ්ඩවල H.S. කේත, සහ (iii) සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියවිලි පිළිබඳ තොරතුරු ලේඛනගත කර හෝ පොදුවේ පහසුවෙන් ලබා ගත හැකි ලෙස හෝ නැත. අදාළ එක් එක් නියෝජිතායතන විසින් පළ කර ඇති ගැසට් පත්‍ර හා නියෝග තුළ සඳහන් වී ඇත්තේ නිෂ්පාදන පිළිබඳ මූලික තොරතුරු හා අනුමැතීන් ලබා ගත යුතු නියෝජිතායතන වල ලැයිස්තුවක් පමණි (1 වන වගුවේ දක්වා ඇති පරිදි).

මෙම ක්‍රමය යටතේ බදු සහන ලබාගැනීමට සිදු කෙරෙන ඉල්ලීම් අනුමත කිරීමේ වගකීම පැවරෙන ආයතන තුන (කෘෂිකර්ම අමාත්‍යාංශය, රාජ්‍ය ෆිස්කල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව) ඒ සඳහා අවශ්‍ය ලියවිලි, සුදුසුකම් පිරික්සීමේ උපමානයන් හෝ බදු වලින් නිදහස් නිෂ්පාදනවලට අදාළ H.S. කේතයන් පිළිබඳ විස්තර ලේඛනගත කර නැත. ඒ නිසා කාර්ය භාර නිළධාරීන් විසින් හෝ නිෂ්කාශණ නියෝජිතයින් හෝ රේගු කාර්යාල නියෝජිතයින් වැනි තෙවැනි පාර්ශවයන් විසින් හෝ ලබා දෙන වාචික මාර්ගෝපදේශයන් මත රඳා පැවතීමට ආනයනකරුවන්ට සිදු වී තිබේ. මෙම අපැහැදිලිතාව පහත දැක්වෙන අහිතකර ප්‍රතිපලවලට මඟ පාදන බව වෙරිටේ විසින් සිදු කළ පර්යේෂණයේ දී අනාවරණය විය.

- ඒකීයත්වයක් නොමැති හා අවිශ්වාසසහගත වාචික උපදෙස් මත රඳා පැවතීමට සිදුවීම නිසා ව්‍යාපාර අවදානමකට මුහුණ දේ

පර්යේෂණය අතරතුර දී සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ කෘෂි ආනයනකරුවෝ, විවිධ ආයතනවල සිටින විවිධ නිළධාරීන්ගෙන් තමන් ලද ඒකීයත්වයක් නොමැති වාචික උපදෙස් පිළිබඳව වාර්තා කළ හ. උදාහරනයක් ලෙස බදු රහිතව ආනයනය සඳහා දෙවැනි නියෝජිතායතනයකින් අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන බව සමහර නියෝජිතායතන ප්‍රකාශ කර සිටිය ද, තම අනුමැතිය අවශ්‍ය බව දෙවැනි නියෝජිතායතනය තරයේ පවසා තිබේ. නිවැරදි හා විශ්වාසකටයුතු තොරතුරු සොයා ගැනීමේ දී ආනයනකරුවන්ට විඳීමට සිදු වන දුෂ්කරතාවයන්ට ඇති සාක්ෂියක් වන්නේ මෙවැනි ගැටුම්කාරී තොරතුරු ය. එමෙන්ම, මෙම විස්තරයන් වාචිකව ලැබෙන බැවින්, තෙවැනි පාර්ශවයක් විසින් අභියෝගයට ලක් කළ හොත් එම තොරතුරු සනාථ කිරීමට නොහැකි වීමෙන් සැලකිය යුතු අවදානමකට මුහුණ පෑමට ව්‍යාපාරවලට සිදු වේ.

- වැය වන කාලය හා පිරිවැය ඉහළ යයි

අදාළ තොරතුරු ලේඛනගත කර නොමැති නිසාත්, අන්තර්ජාල වේදිකාවක් හරහා ලබා ගැනීමට නොහැකි නිසාත් අවශ්‍ය එකී තොරතුරු ලබා ගැනීමට අදාළ රාජ්‍ය ආයතන වෙත පුද්ගලිකවම යෑමට ව්‍යාපාරවලට සිදු වේ. ක්‍රියාවලිය ලේඛනගත වී නොමැති වීම නිසා අදාළ කාර්යභාර නිළධාරියා කාර්ලයේ නොමැති අවස්ථාවල මේ පිළිබඳව සහායක් ලබාදීමට ආයතනය තුළ සිටින සෙසු නිළධාරීන්ට ඇති හැකියාව සීමා වීමද ප්‍රමාද වීම්වලට හේතු වන බව වෙරිටෙ සිදු කළ පර්යේෂණයේ දී අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට මෙන්ම ඉන්පසුව අදාල අනුමැතීන් ලබා ගැනීමට ද අනවශ්‍ය කාලයක් මේ සඳහා වැය කිරීමට ව්‍යාපාරිකයන්ට සිදු වේ. ක්‍රියාපටිපාටියට සම්බන්ධ වන නියෝජිතායතන තුනම පිහිටා ඇත්තේ කොළඹ නිසා බස්නාහිර පළාතෙන් පිටත ස්ථාපිත වී ඇති ව්‍යාපාරවලට වැය කිරීමට සිදුව ඇති කාලය හා පිරිවැය වඩාත් අධික වේ.

තීරණ අයුතු ලෙස නිළධාරී අභිමතයට නතු වීම: ප්‍රකාශයට පත් කරන ලද සුදුසුකම් උපමානයන් හා අදාළ කර ගත හැකි H.S. කේතයන් නොතිබීම, බදු වලින් නිදහස් වීම සඳහා අයදුම්කරුට හා නිෂ්පාදනයට ඇති සුදුසුකම නිර්ණය කිරීමේ දී නිලධාරී අභිමතයට සැලකිය යුතු ඉඩක් විවර කර තබයි. මින් ව්‍යාපාර අනිසි ලෙස පීඩාවකට ලක් වන අතර, එය දූෂණයට ඉඩ විවර කරයි. නිලධාරී අභිමතයන්ට අධිකව යටත් වී ඇති තීරණයන්ගේ ස්වභාවය පුරෝකථනය කිරීමේ හැකියාව ඌණ වේ. නව ව්‍යාපාරවලට සාපේක්ෂව, ඉහළ තලයේ නිළධාරීන් සමඟ දැන

හැඳුනුම්කම් ඇති, සහ සම්බන්ධතා ජාල තිබෙන ප්‍රධාන පෙළේ ව්‍යාපාරවලට වාසිසහගත ලෙස නිල අභිමතයන් ක්‍රියාත්මක වන බව ද වෙරිටෙ පර්යේෂණයේ දී අනාවරණය විය.

ව්‍යාපාර විසින් රජයට ගෙවීමට බැඳී සිටින බදු රජය විසින් ප්‍රකාශයට පත් කරන්නේ ට H.S. කේත අනුසාරයෙනි. ආනයනය සිදු කරන අවස්ථාවේදී බදුවලින් නිදහස ලබන නිශ්චිත නිෂ්පාදනයන් හඳුනා ගැනීමට H.S. කේත යොදා ගැනීමෙන් වඩා නිවැරදිව තීරණ ගැනීමට ව්‍යාපාරවලට ඉඩ සැලසෙනු ඇත. ව්‍යාපාරවලට තම නිෂ්පාදන බදු වලින් නිදහස් නොවූයේ නම් එවිට ගෙවිය යුතු බදු ගණනය කිරීමට ද, බදු වලින් නිදහස්වීම නිසා ලැබෙන සත්‍ය මූල්‍යමය ප්‍රතිලාභය ගණනය කිරීමට ද ඒ අනුව ආනයනය සිදු කරන්නේ ද නැද්ද යන්න තීරණය කිරීමට ද හැකි වනු ඇති එමෙන්ම නිෂ්පාදනයන්ගේ H.S. කේතයන් කලින් දැනගැනීමට හැකි වීමෙන් අනාගත ප්‍රතිඵල පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි වන අතර, බදු වලින් නිදහස්වීම සඳහා නිෂ්පාදනයන්ට ඇති සුදුසුකම ගැන ආනයනය කරන අවස්ථාවෙදී රේගු නිලධාරීන් සමග ආරවුල් ඇති කරගැනීමද ඉන් වැලකෙනු ඇත.

ශ්‍රී ලංකාව තුළ ඇති ලැයිස්තුගත නිෂ්පාදනවලට අදාළ H.S. කේතයන් සොයා ගැනීම අතිශය දුෂ්කර වේ. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකා රේගුව විසින් සපයා දී ඇති අන්තර්ජාල මාර්ගගත H.S. කේත පිරික්සුම් පහසුකම භාවිතා කරමින් සුදුසුකම් ලබන නිෂ්පාදනයන්ට අදාළ H.S. කේතයන් සොයා ගැනීමට වෙරිටේ විසින් දරණ ලද උත්සාහයන්වලදී අර්ථවත් ප්‍රතිඵල ජනනය නොවිණි.[8] අදාළ රජයේ නියෝජිතායතනවල (උදා.කෘ.අමා., මු.අමා., ශ්‍රී.ලං.

2 වන වගුව: තෝරාගත් කෘෂි කාර්මික නිෂ්පාදනයන් හඳුනා ගැනීම සඳහා වෙනත් රටවල් විසින් වෙන් කර ඇති ජාතික තලයේ H.S. කේතයන්ට නිදසුන්

| රට | නිෂ්පාදනයේ විස්තරය | H.S. කේතය |
|---|---|---|
| ඉන්දියාව[9] | එකලස් කිරීමට සූදානම් කර ඇති හරිතාගාර කට්ටල | 9406.00.11 |
| | හරිතාගාර - වෙනත් | 9406.00.19 |
| | කෘෂි කාර්මික / උද්‍යාන වගා කටයුතු සඳහා උපාංග | 8424.81.00 |
| තායිලන්තය[10] | බිංදු වාරි මාර්ග පද්ධති | 8424.82.10 |
| | යාන්ත්‍රික හෝ තාප උපකරණ සවි කර ඇති හරිතාගාර: ප්ලාස්ටික් වලින් නිමැවූ | 9406.00.11 |
| | යාන්ත්‍රික හෝ තාප උපකරණ සවි කර ඇති හරිතාගාරථවෙනත් | 9406.00.19 |
| පාකිස්ථානය[11] | ප්ලාස්ටික ආවරණ හා ශාකමය තෙතමන පටල | 3920.10.00<br>3926.90.99 |
| | පෙර-සැකසූ හරිතාගාර | 9406.10.10<br>9406.90.10 |
| | කෘමිරෝධක දැල් | 5608.19.00 |
| | ආවරණ දැල් | 5608.90.00 |
| ඇීවීජී[12] | කෘෂිකාර්මික හෝ උද්‍යාන වගා වාරිමාර්ග උපකරණ, ස්වයං-ප්‍රචාලන, කේන්ද්‍රවලම්භන | 8424.82.10 |
| | හරිතාගාර | 9406.90.00 |
| වියට්නාමය[13] | යාන්ත්‍රික හෝ තාප උපකරණ සවි කර ඇති හරිතාගාර | 9406.10.10 |
| | බිංදු වාරි මාර්ග පද්ධති | 8424.82.10 |
| | කෘෂිකාර්මික හෝ උද්‍යාන ජල ඉසිනයන් | 8424.20.21 |
| ජපානය[14] | කෘෂිකාර්මික හරිතාගාර | 9406.00.09 |
| | කෘෂිකාර්මික හෝ උද්‍යාන වගා ඉසින | 8424.41.00 |

මූලාශ්‍රය: එම රටවල රජයේ අදාළ නියෝජිතායතන වෙබ් අඩවි

රේ.) අදාළ නිළධාරීන් සම්බන්ධ කර ගනිමින් H.S. කේතවලට අනුව නිෂ්පාදනයන් දැක්වෙන ලැයිස්තුවක් ලබා ගැනීමට දරණ ලද ප්‍රයත්නයන් ද ව්‍යාර්ථ විය. එහෙත්, තෝරා ගත් රටවල් කිහිපයක අදාළ රේගු දත්ත ගබඩා හරහා, ඒ හා සමානව නිෂ්පාදන නාමය අනුව සිදු කළ පිරික්සුම්වල දී අර්ථවත් ප්‍රතිඵල ජනනය විය (2 වන වගුව). බදු වලින් නිදහස් කරගත හැකි නිශ්චිත නිෂ්පාදන හඳුනා ගැනීම සඳහා ජාතික තලයේ H.S. කේතයන් නොමැති වීමෙන්, මේ ක්‍රමය යටතේ යම් නිෂ්පාදනයක් සුදුසුකම් ලබන්නේ දැයි තීරණය කිරීමේ හැකියාව කාර්ය භාර නිළධාරියාගේ අභිමතයට ලක් වේ. මෙය මෙම බදු සහන අවභාවිතයට ඇති ඉඩ ප්‍රස්තා පුළුල් කරයි.

## 1.2 මෙම ක්‍රම අවභාවිතා වීමේ නැඹුරුවක් ඇත

ලේඛනගත ක්‍රියාපටිපාටියක් නොමැති වීම තුළ, බදු රහිතව ආනයනය සඳහා ඉදිරිපත් වන ඉල්ලීමක් අනුමත වීමේ ඉඩ ප්‍රස්ථාවට බලපාන ප්‍රධාන සාධකයක් බවට නිල අභිමතය පත් වේ. රජයේ නිලධාරීන් සමග ඇති කරගත් පුද්ගලික හැඳුනුම්කම්/බලපෑම් හා සබඳතා හරහා මෙවැනි විනිවිදභාවයකින් තොර පීඩාකාරී සහ කල් ගතවන ක්‍රියා පටිපාටි මඟ හැර යාමට ආනයනකරුවන් පෙළඹේ. එමෙන්ම, තම නිෂ්පාදනයන් ආනයන බදුවලින් නිදහස් කරගැනීමෙන් ආනයනකරුවන්ට සිදු කර ගත හැකි ඉතිරිය ද ඉහළ ය. ආනයනකරුවන් සමඟ සිදු කළ සම්මුඛ පරීක්ෂණවලට අනුව, හරිතාගාර යනු, 'පිරි-සැකසූ සැකිලි' යන පුළුල් නිෂ්පාදන කාණ්ඩය යටතට ගැනෙන නිෂ්පාදනයකි. හරිතාගාර නොවන වෙනත් නිෂ්පාදන ද එකී කාණ්ඩය යටතේ ඇත. ලේඛනගත ක්‍රියා පටිපාටියක් නොමැති වීම හා එවැනි අවස්ථාවල සිදු වන ප්‍රමාද දෝෂයන් හේතුවෙන්, මෙහි අපේක්ෂිත ප්‍රතිලාභීන් නොවන පාර්ශවවලට මෙම ක්‍රම යටතේ අනෙකුත් නිෂ්පාදන ආනයනය කරමින් මේ ක්‍රම අවභාවිතා කිරීමට ඉඩකඩ ඇත.

බදුවලින් නිදහස් කර ගැනීමේ යෝජනා ක්‍රම හරහා ආනයනික භාණ්ඩ පිලිබඳ දත්ත පල නොකිරීම නිසා අවභාවිතාවන් සොයා ගැනීම දුෂ්කර වී තිබේ. ආනයන සංඛ්‍යාන දත්ත ඉල්ලා සිටිමින් ඉදිරිපත් කරන ලද තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) පිලිබඳ පනත යටතේ ඉදිරිපත් කළ ඉල්ලුම්පත සඳහා ශ්‍රී ලංකා රේගුව වෙතින් ලැබුණු ප්‍රතිචාරයට අනුව, බදු නිදහස් ක්‍රම යටතේ සිදු කෙරෙන ආනයනයන් ගැන සංඛ්‍යා දත්ත ඔවුන් විසින් පවත්වා ගෙන යන්නේද යන්න ගැන සැකයක් ජනිත වේ. තො.දැ.අ. ඉල්ලුම්පතේ මෙම යෝජනා ක්‍රම ගැන සඳහන් කළ අතර, අදාළ ගැසට් නිවේදනයේ ලැයිස්තුගත කර ඇති නිෂ්පාදන නාමයන් සපයා දී තිබුණි. තො.දැ.අ. ඉල්ලුම්පත සඳහා ශ්‍රී.ලං.රේ. විසින් එවූ ප්‍රතිචාරයේ[15] සඳහන් කර තිබුණේ ලැයිස්තුගත කර ඇති නිෂ්පාදනවල H.S. කේතයන් සඳහන්ව නැති බැවින් තමන්ට එම තොරතුරු ලබා දිය නොහැකි බවයි. ඉහත සිදු කළ සාකච්ඡාවල දී මතු කළ පරිදි, බදු නිදහස හිමි නිෂ්පාදන ලැයිස්තුව මහජනයාට වර්තමානයේ දී ලබා ගත හැක්කේ H.S. කේතයෙන් නොව නිෂ්පාදන නාමයෙන් පමණි. අනුමැතියන් ලබා දෙන අධිකාරීන් (කෘෂිකර්ම අමාත්‍යාංශය හා මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව) ද මෙකී H.S. කේතයන් පිළිබඳව නොදැනුවත් ය. ඒ අනුව, දැනට පවත්නා බදු නිදහස් ක්‍රම යටතේ රට තුළට ආනයනය කරන නිෂ්පාදනවලට අදාළ H.S. කේතයන්ගේ තොරතුරු හිමි එකම අධිකාරිය වන්නේ යම් නිෂ්පාදනයක් ආනයනය කරන අවස්ථාවේ දී එය බදු නිදහසට සුදුසුකම් ලබන්නේදැයි අවසන් වශයෙන් තීරණය කරන ශ්‍රී ලංකා රේගුව පමණි.

ආනයන සංඛ්‍යාන දත්ත ලබා ගත නොහැකි වීම නිසාත්, නිෂ්පාදනයන් H.S. කේතයන්ගෙන් හඳුනා නොගන්නා නිසාත් අවභාවිතාවන් සිදු වන්නේ ද සහ එය කෙතරම් දුරකට සිදු වන්නේ ද යන්න සොයා ගත නොහැකි වී ඇත. අවභාවිතාවන් මැඩලීම සඳහා ස්ථාපිත කර ඇති වත්මන් ක්‍රියාපටිපාටිය සලකන කළ, අදාළ ක්‍රියාපටිපාටිය උල්ලංඝණය වන අවස්ථා සොයා ගැනීමට ඇති නොහැකියාව බරපතල දෝෂයකි. ඊට අමතරව, මෙහි ඉලක්කගත ප්‍රතිලාභීන්ට, විශේෂයෙන්ම මිල අධික උපකරණ මිලට ගැනීමට අපහසු වගාකරුවන්ට, වර්තමාන ක්‍රමය තුළ බදු වලින් නිදහස ලබාගැනීමට එක සමාන ප්‍රවේශ අවස්ථා සැලසෙන්නේද නැත.■

*The Economics Research Team of Verite Research compiled this study. The team comprised of Hasna Munas and Revathy Gnanasampathen. Editorial support was provided by Azra Jafferjee. Overall research and editorial supervision was provided by Subhashini Abeysinghe and Nishan de Mel.*

*The team would like to thank the Ceylon Chamber of Commerce and the Federation of Chamber of Commerce for facilitating this research. The team would also like to thank the Chamber of Commerce and Industry of Central Province, the Galle District Chamber of Commerce and Industry, the Trincomalee District Chamber of Commerce and Industry, the Chamber of Commerce and Industries of Yarlpanam, the Batticloa District Chamber of Commerce Industry and Agriculture, the Ampara District Chamber of Commerce and Industry, the Sabaragamuwa Province Chamber of Commerce and Industry, the Hambantota District Chamber of Commerce, the Matara District Chamber of Commerce, the Wayamba Chamber of Commerce and Industry and the Anuradhapura District Chamber of Commerce, Industry and Agriculture for their insights and support.*

## සටහන්

[1] සුසංයෝගී වර්ගීකරණ පද්ධති H.S. කේත-ලෝක රේගු සංවිධානය විසින් සුසංයෝගී වර්ගීකරණ පද්ධතිය නිර්මාණය කරන ලද්දේ අපනයනවල නිෂ්පාදන සංකේන්ද්‍රතාව හා සංයුතිය ගැන තක්සේරු කිරීමට ය. නිෂ්පාදන වර්ගීකරණයේ දී ගෙන එන විස්තරයන්ගේ මට්ටම, ඉදිරිපත් කරන H.S. මට්ටම මත රඳා පවතී. උදාහරණයක් ලෙස අංක 4 කින් වර්ගීකරණය කර ඇති නිෂ්පාදනයක් අංක 2ක මට්ටමින් කර ඇති වර්ගීකරණයකට වඩා නිශ්චිත වේ. උදාහරණයක් ලෙස කිරි අංක 2 කින් වර්ගීකරණය කර H.S. 04 ලෙස දැක්වෙන අතර, සාන්ද්‍ර කිරි H.S. 0402 ලෙස ඉලක්කම් 4 ක මට්ටමින් වර්ගීකරණය කෙරේ. සුසංයෝගී පද්ධතියට අනුව ආනයනයන් හැඳින්වෙන්නේ කේතයක් මගිනි. අන්තර්ජාතික වර්ගීකරණය අංක 6ක් දක්වා දීර්ඝව යෙදෙන අතර, අමතර ඉලක්කම් 2ක් හෝ 4ක් එක් කිරීම මගින් යම් රටකට තම ජාතික තලයේ දී මෙය තව දුරටත් අනු බෙදීමට ලක් කළ හැකි වේ.

[2] මුදල් අමාත්‍යාංශය□ 2017 අයවැය කථාව.

[3] I. Abara and S. Singh. Ethics and Biases in Technology Adoption: The Small Farm Argument. 1993. Technological Forecasting and Social Change Vol. 43, pp. 289-300.

[4] Athukorala, Premachandra, et al., eds. The Sri Lankan Economy: Charting A New Course. Asian Development Bank (2017). https://www.adb.org/sites/default/files/publication/373316/sri-lankan-economy.pdf හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[5] 1962 අංක 19 දරණ ආදායම් බදු ආරක්ෂණ පනතේ ආදායම් බදු නියෝග අං.02/2017 හි ii වන ඇමුණුම. 2017 පෙබරවාරි 16 දිනැති 42/2006 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය. http://www.treasury.gov.lk/documents/10181/46038/2006-42+Revenue+Protection+Order+No.+022017/ff23cb72-3bbd-4667-bd03-b87c31f30b47?version=1.0 හි ඇත [2018 මාර්තු 2 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[6] ශ්‍රී ලංකා රේගුවල 1979 අං.40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වන කොටස යටතේ එන විධානයල: http://www.customs.gov.lk/public/files/tariff/cess2018.pdf හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[7] ආදායම් බදු දෙපාර්තමේන්තුවී එකතු කළ අගය මත බද්ද (VAT) - මුක්තිය ලබන භාණ්ඩ හා සේවාවන්ගේ උපලේඛනයී 2016 නොවැම්බර් 01: http://www.ird.gov.lk/en/Lists/Latest%20News%20%20Notices/Attachments/92/Schedule%20of%20Goods%20or%20Services%20Exempted%20from%20VAT.pdf හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[8] ශ්‍රී ලංකා රේගුවී එච් එස් කේත සෙවුම: http://www.customs.gov.lk/business/hsfinder හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[9] වාණිජ දෙපාර්තමේන්තුව, ඉන්දියානු රජය, අපනයන ආනයන දත්ත බැංකුව: http://commerce.nic.in/eidb/searchq.asp?fl=Icomq.asp හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[10] තායි රේගුවී සමෝධානිත තීරු බදු දත්ත සංචිතය: http://igtf.customs.go.th/igtf/en/main_frame.jsp?lang=en&left_menu=menu_integrated_tariff_search හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[11] PkRevenue.com. FBR කෘෂි ක්ෂේත්‍රයට අනුව භාණ්ඩ ආනයනයට ඇති රේගු බදු FBR මගින් යාවත්කාලීන කෙරේ: http://www.pkrevenue.com/customs/fbr-updates-customs-duties-on-import-of-goods-by-agri-sector/ හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[12] ඇ.එ.ජ. අන්තර්ජාතික වෙළඳ කොමිසමී ඇ.එ.ජ. අන්තර්ජාතික වෙළඳ කොමිසම: https://hts.usitc.gov/?query=8424 හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[13] වියට්නාම් රේගුවී තීරුබදු දත්ත සංචිතය: https://www.customs.gov.vn/SitePages/Tariff-Search.aspx?language=en-US හි ඇත [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[14] ජපාන රේගුවග 2018 ජනවාරි වන විට ජපානයේ තීරු බදු උප ලේඛනය: http://www.customs.go.jp/english/tariff/2018_1/index.htm [2018 මාර්තු 27 දින අවසන් වරට ප්‍රවේශ වන ලදී].

[15] ශ්‍රී ලංකා රේගුව. රේගු ආනයන බද්ද, සෙස් බද්ද සහ එකතු කළ අගය මත බද්දෙන් මුක්තිය ලැබීමේ ක්‍රම යටතේ ආනයනය කළ කෘෂිකාර්මික උපකරණ පිළිබඳව සී/ස වෙරිටේ රිසර්ච් පුද්ගලික සමාගම විසින් කළ තොරතුරු ඉල්ලීමට ලද ප්‍රතිචාරය. 2017 දෙසැම්බර් 08.